# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2311/46 - 2022 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :-* BD/BD/LND/3/5/96-1.
*ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:-* එල්ඩී/05/2005/ ඊ/17.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවයේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ, අංක 80H ග්ලේන්ඇල්පීන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හංවැල්ල ගමේ සර්වේයර් ජනරාල් වෙනුවට බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් 2007.05.14 දිනැතිව පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 80, අතිරේක 52, පත්‍ර අංක 48 - මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 11.3652

උපලේඛන අංක 01

01. කැබලි අංක 673
ඉඩමේ නම: සියඹලාගහවත්ත (කොටසක්) අඟුරුපිස්සගොඩ පතන *හෙවත් ග්ලේන් ඇල්පීන් වත්තේ හිඟුරුගමුව කොටස*; වර්තමාන ඉඩම් පරිහරණය: තේ (පැරණි) හා ලඳු කැලය; හිමිකම් පාන්නාගේ නම: ග්ලේන් ඇල්පින්වත්ත, බලංගොඩ වැවිලි සමාගම; වෙනත් කරුණු; 22 හා 33 වැනි බිම් කැබලිවල කොටස, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍යාව ඇත, රජයට අත්පත් කර ගැනීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.9030

02. කැබලි අංක 674
ඉඩමේ නම: අඟුරුපිස්සගොඩ පතන *හෙවත් ග්ලේන් ඇල්පීන් වත්තේ හිඟුරුගමුව කොටස*; වර්තමාන ඉඩම් පරිහරණය: තේ (පැරණි) හා ලඳු කැලය; හිමිකම් පාන්නාගේ නම: ග්ලේන් ඇල්පීන්වත්ත, බලංගොඩ වැවිලි සමාගම; වෙනත් කරුණු; 33 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍යාව ඇත, රජයට අත්පත් කර ගැනීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 1.1709

03. කැබලි අංක 675
ඉඩමේ නම: අඟුරුපිස්සගොඩ පතන *හෙවත් ග්ලේන් ඇල්පීන් වත්තේ හිඟුරුගමුව කොටස*; වර්තමාන ඉඩම් පරිහරණය: තේ (පැරණි) හා ලඳු කැලය; හිමිකම් පාන්නාගේ නම: ග්ලේන් ඇල්පීන්වත්ත, බලංගොඩ වැවිලි සමාගම; වෙනත් කරුණු; 33 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍යාව ඇත, රජයට අත්පත් කර ගැනීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 9.2913

1A - G 38407 – 40 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛන අංක 02

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ, 80H ග්ලේන්ඇල්පින් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රඹුක්පොත ගමේ, සර්වේයර් ජනරාල් වෙනුවට බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් 2006.12.27 දිනැතිව පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 37, අතිරේක 43, පත්‍ර අංක 41 - මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2.604

**01. කැබලි අංක 731**

ඉඩමේ නම: අඟුරුපිස්සගොඩ පතන *හෙවත්* හිඟුරුගමුව වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: තේ (පැරණි); හිමිකම් කියන්නා: රජය; බදුල්ල බහු තාක්ෂණික ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාරදීම සඳහා මැන ඇත. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍යව ඇත, අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 2.604

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.01.26 වැනි දින ප.ව. 2.30ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2022.01.19 වැනි දිනට මත්තෙන් මෙම ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**ඩී. එම්. එල්. එච්. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0291

---

ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :-* DIV/MW/LND/3/1/2-1.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය:-* 4-3/9/2014/WS/15.

2020 අගෝස්තු 27 වැනි දින අංක 2190/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටස - ඉඩම් යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ දැන්වීමෙහි කු. 2458 කැබලි අංක 01 සඳහා සඳහන් දිනය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉවත් කළ යුතු දිනය : 2020.11.18
ඉවත් කළ යුතු දිනය වෙනුවට
ආදේශ කළ යුතු දිනය : 2023.01.04

**එම්. එස්. ජානක,**
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0292

---

ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :-* DIV/MW/LND/3/1/2-7.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය:-* 4-3/16/2017/PT/270.

2020 ඔක්තෝබර් 05 වැනි දින අංක 2196/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටස - ඉඩම් යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ දැන්වීමෙහි අ.ග.පි. 1107 පිඹුරෙහි සඳහන් ප්‍රමාණයන් හෙක්ටයාර් 0.0127 වූ ඉඩම් කොටස සඳහා හිමිකම් පරීක්ෂණ දිනය 2020.11.11 ලෙස සඳහන් වුවද එය ඉවත් කොට ඒ වෙනුවට 2023.01.25 දිනය ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉවත් කළ යුතු දිනය : 2020.11.11
ඉවත් කළ යුතු දිනය වෙනුවට
ආදේශ කළ යුතු දිනය : 2023.01.25

**එම්. එස්. ජානක,**
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0293

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.